# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1768/35 - 2012 ජූලි මස 27 වැනි සිකුරාදා - 2012.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ, 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 64 වැනි වගන්තියෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය, හේවා මාතරගේ උපාලි කොඩිකාර වන මා වෙත පැවරී ඇති බලතල අනුව කරන නියෝගයයි.

හේවා මාතරගේ උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ
ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ක් වූ ජූලි මස 17 වැනි දින,
බත්තරමුල්ලේ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 204 දරන ස්ථානයේ පිහිටි
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,
ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

#### නියෝගය

ඉහත කී බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 64 වැනි වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත සඳහන් කරනු ලබන දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය, ඉහත කී බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 38(1) වගන්තියේ සඳහන් විධිවිධානයන්ගෙන් නිදහස් කරමි.

1. සී/ස ගම්පහ දිස්ත්‍රික්කයේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය.

08 - 233